පොහොර භාවිතයේදී වැදගත් වන උපදෙස්

ආරක්ෂාකාරීව හා නිවැරදිව
පොහොර භාවිතය තුලින්
පරිසරයත් සුරකිමින් වැඩි අස්වනු
හා ලාභ අත්කරගමු.

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් ගොවීන්ගේ සහ කෘෂි ව්‍යාප්ති නිලධාරීන්ගේ පරිශීලනය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට අනුකූලව මෙම අත්පොත සකස්කර ඇත.

තාක්ෂණික මගපෙන්වීම හා උපදේශකත්වය:

1. **එන්.ආර්.එන්. සිල්වා මහත්මිය.**
   ප්‍රධාන කෘෂිකර්ම විද්‍යාඥ (පාංශු විද්‍යාව)
2. **ආචාර්ය එම්.ඒ.පී. මායාකඩුව මෙනවිය.**
   සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)

   උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,
   කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

අන්තර්ගතයේ නිර්මාණකරුවන්:

1. කැලුම් නිශාන්ත වඩුමේස්ත්‍රිගේ මහතා.
   යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ විශේෂඥ, SAFE ව්‍යාපෘතිය.
2. යොකෝ නගතා (Yoko Nagata) මහත්මිය
   උද්‍යාන බෝග විද්‍යා විශේෂඥ, SAFE ව්‍යාපෘතිය.
3. ආචාර්ය ආර්.එස්.කේ. කීර්තිසේන මහතා
   කෘෂිකර්ම විශේෂඥ, SAFE ව්‍යාපෘතිය.

කාටූන්, පිටකවර සහ පිටු නිර්මාණය:
අවන්ත ආටිගල

මුද්‍රණය:
නෙත්වින් ප්‍රින්ටර්ස් - ගැටඹේ
දු. ක. 081 238 6908

2025 දෙසැම්බර්

බලන්නකෝ මහත්තයෝ මෙදා පාරත් මගේ අස්වැන්න හොඳටම අඩු වෙලා. මට මගේ අස්වැන්න වැඩි කරගන්න ඕනැ. මහත්තයා මට හොඳ පොහොර එකක් ගන්න තැනක් කියන්න!
වෙළඳ පොළේ තියන පොහොර බොහොමයක් හොඳයි ප්‍රශ්නේ තියෙන්නේ අපි හරියට පොහොර දානවද කියන එක!

හරියට පොහොර දාන්නේ කොහොමද?
එක මම කියලා දෙන්නම්!
ඉස්සර වෙලාම අපි බලමු බෝග වගාවලට පොහොර යෙදිය යුත්තේ ඇයි කියල. මිනිසුන්ට වගේම බෝගවලටත් ඒවායේ වර්ධනය සහ ජීවන චක්‍රය සම්පූර්ණ කර ගැනීමට වාතය ජලය හා ආහාර අවශ්‍ය වෙනවා.
උදා: මිනිස්සු එයාලට අවශ්‍ය ඔක්සිජන් හුස්ම ගැනීමෙන් ලබා ගන්නවා වගේම බෝගත්, එයාලට අවශ්‍ය ඔක්සිජන් හුස්ම ගැනීමෙන් ලබා ගන්නවා. බෝග හුස්ම ගන්නේ පත්‍ර මගින් හා මුල් මගින්.

බෝග එයාලට අවශ්‍ය ආහාර එයාලම නිපදවා ගන්නවා. ආහාර නිපදවන්න අවශ්‍ය ශක්තිය - හිරු එළියෙනුත්, පෝෂක - වාතයෙන්, ජලයෙන් හා පසෙන් ලබා ගන්නවා.



1 බෝග වගාවේදී පොහොර දැමීම සිදු කල යුත්තේ ඇයි?

අපි බලමු වනාන්තරයක දී ගහ කොළ හොඳින් වැඩීම සඳහා, එයාලට අවශ්‍ය පෝෂක ලබා ගන්නේ කොහොමද කියලා. ඒවගේම පසට පෝෂක ලැබෙන්නේ කොහොමද කියලා.



ගහ කොළ ඔවුන්ගේ වර්ධනයට හා පැවැත්ම සඳහා අවශ්‍ය පෝෂක සියල්ල පසෙන් ලබා ගැනීම සිදු කරනවා. වනාන්තරයක දී ගස්වල ගෙඩි, කොළ, අතු, සහ සත්ත්ව මළපහ පස මත වැටී ක්ෂුද්‍ර ජීවීන් මගින් දිරාපත් වීමෙන් ඒවායේ අඩංගු පෝෂක සියල්ලම වගේ එම පසට නැවත ලැබෙනවා. ඒ නිසා පසේ පෝෂකවල අඩු වීමක් සිදු වෙන්නේ නැහැ. ඒ නිසා වනාන්තර වගේ ස්වභාවික පරිසර තත්වයකදී ගස් කොළන් වලට පිටතින් පෝෂක ලබාදීම අවශ්‍ය වෙන්නේ නෑ.



කෘෂිකාර්මික වගා බිමක දී බෝග වල ගෙඩි, කොළ, බීජ වැනි කොටස් අපි අස්වැන්න ලෙස ඉවත් කර ගන්නවා. ඒවා මිනිසුන්ගේ හා සතුන්ගේ ආහාර සඳහා වෙළඳපොලට හෝ කර්මාන්තශාලා වලට ගෙන යනවා. ඒනිසා පසෙන් බෝගවලට ලබාදෙන පෝෂක ප්‍රමාණයෙන් වැඩි කොටසක් නැවත එම පසට ලැබෙන්නේ නෑ. ඒ හේතුවෙන් පසේ පෝෂක අඩු වීමක් සිදු වෙනවා.

මේනිසා බෝග වගාවේදී බෝගවලට අත්‍යාවශ්‍ය පෝෂක රසායනික හෝ කාබනික පොහොර ලෙස පිටතින් ලබා දෙන්න වෙනවා.

2 බෝග වර්ධනය සඳහා බලපාන දේවල් මොනවාද?

බෝග ඒවාට අවශ්‍ය ශක්තිය, වාතය, ජලය සහ පෝෂක ලබා ගන්නා ආකාරය මේ පොස්ටරය දිහා බැලුවාම තේරුම් ගන්න පුළුවනි.



3 බෝග සඳහා අත්‍යවශ්‍ය පෝෂක මොනවාද?

I. ව්‍යුහාත්මක පෝෂක [Structural Nutrients] – (C, H, O)

බෝගයේ ව්‍යුහය (කඳ, කොළ, මුල්, මල්, ගෙඩි ආදී) ගොඩනැගීම සඳහා අවශ්‍ය කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන සහ ලිපිඩ වැනි සියලුම කාබනික සංයෝගවල මූලික කොටස් හදන්නේ කාබන් (C) හයිඩ්‍රජන් (H) සහ ඔක්සිජන් (O) යන පෝෂක වලින්. එම පෝෂක ව්‍යුහාත්මක පෝෂක ලෙස හඳුන්වනවා.

මෙම පෝෂක බෝග වලට වැඩියෙන්ම අවශ්‍ය වෙනවා. බෝග, ව්‍යුහාත්මක පෝෂක (C,H,O) ප්‍රධාන වශයෙන් වාතයෙන් සහ ජලයෙන් ඇති තරම් ලබා ගන්නා නිසා පොහොර ලෙස පිටතින් ලබා දීම අවශ්‍ය වන්නේ නැහැ.

II. ප්‍රාථමික පෝෂක [Primary Nutrients] – (N, P, K)

අපි කවුරුත් දන්නා නයිට්‍රජන් (N), පොස්පරස් (P) සහ පොටෑසියම් (K) තමයි ප්‍රථමික පෝෂක කියල කියන්නේ. මෙම පෝෂක විශාල ප්‍රමාණවලින් අවශ්‍ය වන අතර, හිඟ වුනොත් බෝග වර්ධනයත් අස්වැන්නත් අඩු වෙන්න පුළුවනි.

නයිට්‍රජන් (N) : බෝග වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය ප්‍රෝටීන් සංස්ලේෂණයට දායක වනවා. බෝගයේ හරිතප්‍රද, ප්‍රෝටීන සහ කොළ, කඳ සහ සියලු කොටස් වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වෙනවා.

පොස්පරස් (P) : බෝගයේ ශක්ති හුවමාරුව, මූල මණ්ඩලය වර්ධනය, මල් පිපීම, බීජ සහ ගෙඩි හැදීමට අත්‍යාවශ්‍ය පෝෂකයක් වෙනවා.

පොටෑසියම් (K) : බෝගයේ එන්සයිම සක්‍රිය කිරීම, ජලය සහ පෝෂක වල ගමනාගමනය නියාමනය සහ සමස්ත බෝගයේ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කරනවා.

III. ද්විතියික පෝෂක [Secondary Nutrients] – (Ca, Mg, S)

ද්විතියික පෝෂක සෞඛ්‍ය සම්පන්න බෝග වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වෙනවා.

- **කැල්සියම් (Ca):** බෝගයේ නිරෝගී, ශක්තිමත් වර්ධනයක් සඳහා වැදගත් වෙනවා වගේම බෝගයේ මුල් සහ අංකුර වර්ධනයට උපකාරී වෙනවා.
- **මැග්නීසියම් (Mg):** බෝග වලට මැග්නීසියම් පෝෂකය හරිතප්‍රද වර්ධනයට, ආහාර නිෂ්පාදනයට සහ ප්‍රවාහනයට සහ පොස්පරස් පෝෂකය උරා ගැනීමට සහ ප්‍රවාහනයට වැදගත් වෙනවා.
- **සල්ෆර් (S):** බෝග වලට අවශ්‍ය ප්‍රෝටීන සෑදීම සඳහා අවශ්‍ය ඇමයිනෝ අම්ල වර්ග හදාගන්න වැදගත් වෙනවා.

සාමාන්‍යයෙන් අපි බත් ගොඩක් එක්ක එළවළු, පලා වර්ග, මස් මාළු ටික ටික කනවා. ඒවගේම බෝග වලට ප්‍රථමික පෝෂක (N,P,K) ගොඩක් එක්ක ද්විතික පෝෂක (Ca,Mg,S) ටික ටික අත්‍යාවශ්‍ය වෙනවා. එනිසා පොහොර ලෙස N,P,K වැඩියෙනුත් Ca,Mg,S අඩුවෙනුත් යෙදීම සිදු කරනවා.

IV. ක්ෂුද්‍ර පෝෂක [Micro Nutrients]

ක්ෂුද්‍ර පෝෂක (Fe, Mn, Zn, Cu, B, Mo, Cl, Ni) ඉතාම කුඩා ප්‍රමාණවලින් අවශ්‍ය වන අත්‍යාවශ්‍ය පෝෂක වෙනවා. බොහෝ විට හෙක්ටයාරයකට ග්‍රෑම් කිහිපයක් පමණක් අවශ්‍ය වෙනවා. ඉතාම කුඩා ප්‍රමාණවලින් අවශ්‍ය වුනත්, ක්ෂුද්‍ර පෝෂක නොමැතිව බෝගවලට තම ජීවන චක්‍රය සම්පූර්ණ කරගන්න බැහැ.

ක්ෂුද්‍ර පෝෂක එන්සයිම සක්‍රීය කිරීම, හෝමෝන නියාමනය, ප්‍රභාසංස්ලේෂණය, නයිට්‍රජන් තිර කිරීම සහ ප්‍රජනන ක්‍රියාවලීන්හිදී බෝග වලට අත්‍යවශ්‍ය වෙනවා.

සාමාන්‍යයෙන් බොහෝ කෘෂිකාර්මික පසෙහි ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණවත් තරම් තිබෙන නිසා ඒවා පොහොර ලෙස වෙනම පසට එකතු කරන්න අවශ්‍ය වන්නේ නැහැ. ඒ වගේම පසට එකතු කරන කාබනික ද්‍රව්‍ය මගින් බෝග වලට අත්‍යාවශ්‍ය ද්විතික සහ ක්ෂුද්‍ර පෝෂක සියල්ලම වාගේ පසට ලබා දෙනවා.

නමුත්, අසනීප හෝ විශේෂිත තත්ත්ව වලදී මිනිසුන් විටමින් ලබා ගන්නවා වගේ, බෝග වලටත් ඌණතා ලක්ෂණ පෙන්වන අවස්ථා වලදී හෝ අස්වැන්නේ ගුණාත්මය වැඩි කිරීමට අවශ්‍ය අවස්ථා වලදී ක්ෂුද්‍ර පෝෂක බාහිරින් ලබා දීම සිදුකල යුතු වෙනවා.

ඉතාම කුඩා ප්‍රමාණවලින් අවශ්‍ය වන නිසා ක්ෂද්‍ර පෝෂක ලබා දීම ඉතාම ප්‍රවේශමෙන් සිදු කල යුතුයි. මොකද වැඩිපුර යෙදුවොත් එම ක්ෂුද්‍ර පෝෂක බෝග වලට විෂ වීමට බොහෝ විට ඉඩ ඇති නිසා. ක්ෂුද්‍ර පෝෂක යෙදීමේදී ඔබ ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකගේ සහය ලබා ගන්න.



බෝග වලට අත්‍යාවශ්‍ය
පෝෂක පිරමිඩයක් ඉහත දැක්වේ

4 බෝග වර්ධනය සඳහා පෝෂක වල දායකත්වය





5 බෝග වර්ධනය සඳහා මුල් වල දායකත්වය

බෝග අපි වගේම හුස්ම ගන්නවා. බෝග හුස්ම ගන්නේ පත්‍ර කඳ සහ මුල් මගින්. ඒ අනුව, බෝග එයාලට අවශ්‍ය ඔක්සිජන් වලින් කොටසක් සහ ජලය හා පෝෂක ලබා ගන්නෙ මුල් මගින්. මෙහිදී මුල් වල ඇති මූල කේෂ (ඉතා සිහින් කුඩා මුල්) මගින් ජලයේ දියවී ඇති පෝෂක (අයන ලෙස), ජලය සමග බෝගයට උරා ගෙන බෝගයේ වර්ධනයට හා පැවැත්මට අත්‍යාවශ්‍ය විවිධ ක්‍රියා සඳහා අදාල සෛල වෙත ප්‍රවාහනය කරනවා.

ඒ නිසා සෑම පොහොර යෙදීමකට පෙර, බෝග වලට නිසි ජල සම්පාදනයක් ලබා දී පසේ තෙතමනය නිසි මට්ටමට සකසා ගන්න ඕනා.

නිරෝගී හොඳින් වැඩුණු බෝගයක් නිර්මාණය කර ගැනීම සඳහා නිරෝගී මූල මණ්ඩලයක් අත්‍යාවශ්‍ය වෙනවා.

සෞඛ්‍ය සම්පන්න හොඳින් වැඩුනු මූල මණ්ඩලයක වර්ධනයට, දියුණු පාංශු ව්‍යුහයක් සහ පාංශු වයනයක් සහිත සාරවත් පසක් අවශ්‍ය වෙනවා. එවැනි පසකට බෝග මුල් වලට වගේම පසේ ජීවත් වන ක්ෂුද්‍ර ජීවීන් ඇතුළු පාංශු ජීවීන්ට අවශ්‍ය, ප්‍රමාණවත් පාංශු වාතනයක්, පාංශු උෂ්ණත්වයක් සහ බෝග වලට අවශ්‍ය පාංශු පෝෂක හා තෙතමනය රඳවා ගන්නත් පුළුවන්.

සියුම් මුල් පසෙන් ජලය, ඔක්සිජන් සහ පෝෂක අවශෝෂණය කරයි.



6 බෝග වර්ධනයේදී පසෙහි කාර්යභාරය / බෝග සඳහා පස වැදගත් වන්නේ ඇයි?

පස බෝග වර්ධනයට සහාය වන තීරණාත්මක කාර්යයන් කිහිපයක් ඉටු කරනු ලබනවා. අපි බලමු ඒ මොනවද කියලා:

- **භෞතික සහයෝගය**
  පස බෝගවල මූල පද්ධතිය වර්ධනය වීමටත්, ස්ථාපිත වීමටත් අවශ්‍ය මාධ්‍ය සහ ඉඩ ලබා දෙනවා. සුළඟ සහ වර්ෂාව වැනි පාරිසරික බලවේගයන් හමුවේ ස්ථාවර ලෙස නැගීසිටීමට ආධාර ලබා දෙනවා.

- **ජලය සංචිත කර තබා ගැනීම**
  පස බෝගවල වර්ධනයටත් පැවැත්මටත් අවශ්‍ය ජලය රඳවා තබා ගන්නවා. බෝග පසේ ඇති ජලය මුල් හරහා ලබා ගන්නා අතර මෙම ජලය ප්‍රභාසංස්ලේෂණය, පෝෂක ප්‍රවාහනය සහ බෝගයේ පැවැත්මට අවශ්‍ය සියළු ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්නවා.

වායු හුවමාරුව පවත්වා ගැනීම
පස මගින් බෝගවලට හා පාංශු ජීවීන්ට අවශ්‍ය වාතය ගබඩා කර තබා ගන්නවා. එම වාතය බෝගයේ මූල ශ්වසනයෙදී ඔක්සිජන් සහ කාබන් ඩයොක්සයිඩ් වැනි වායූන් හුවමාරු කර ගැනීමට ඉඩ සලසන අතර බෝගයේ නිරෝගී වර්ධනයට අත්‍යාවශ්‍ය වෙනවා.

ක්ෂුද්‍ර ජීවී වාසස්ථාන සැපයීම
පස, කාබනික ද්‍රව්‍ය හා අනෙකුත් සංඝටක බිඳදමමින් බෝග සඳහා අත්‍යාවශ්‍ය පෝෂක චක්‍රය පවත්වා ගැනීමට දායක වන විවිධ ක්ෂුද්‍ර ජීවීන්ට අවශ්‍ය නිවහන සපයා දෙනවා.

පෝෂක ප්‍රභවයක් ලෙස
බෝග වර්ධනය සඳහා අත්‍යවශ්‍ය පෝෂක සපයන කාබනික ද්‍රව්‍ය හා ඛනිජ ද්‍රව්‍ය පසෙහි අඩංගු වෙනවා. මෙම පෝෂක බෝගයේ මුල් මගින් උරාගෙන බෝගයේ වර්ධයට සහ පැවැත්ම සඳහා යොදා ගන්නවා.

7 ඔබේ ඊළඟ වගාවට ප්‍රථම පස පරීක්ෂා කරගත යුත්තේ ඇයි?

නව බෝග වගාවක් ආරම්භයට පෙර, පස පරීක්ෂා කර ඒ අනුව අවශ්‍ය ප්‍රමාණයට පමණක් පෝෂක පසට යෙදීම, පස නිවැරදිව කළමනාකරණය කිරීමේ වැදගත් පියවරක් වෙනවා. මේ නිසා දීර්ඝ කාලයක් අඛණ්ඩව බෝග වගාවෙන් ආර්ථිකව වාසිදායි අස්වැන්නක් ලබා ගැනීමට හැකියාව ලැබෙනවා.

දැන් අපි පස පරීක්ෂා කිරීම මගින් ලැබෙන වාසි මොනවද කියලා බලමු.

පසේ අඩංගු පෝෂක පිළිබඳ තක්සේරුවක් ලබාදීම : පාංශු පරීක්ෂාව මගින් බෝග වර්ධනයට අත්‍යවශ්‍ය වන නයිට්‍රජන් (N), පොස්පරස් (P), පොටෑසියම් (K), වැනි අත්‍යවශ්‍ය පෝෂක මට්ටම් පිළිබඳ තොරතුරු සපයනවා. එමගින් ඔබේ පසේ පෝෂක ඌණතාවයක් හෝ අතිරික්තයක් තිබෙනවද කියල දැන ගන්න පුළුවන්. ඒවගේම ඔබට පොහොර යෙදිය යුතු නිර්දේශයක් ලබා දෙනවා.

පසේ pH අගය දැන ගැනීමට හැකිවීම

pH අගය මගින් පසේ ආම්ලික හෝ භාෂ්මික මට්ටම පිළිබඳ අදහසක් ලබාදෙයි. පසෙහි pH අගය, බෝගවල පසෙන් පෝෂක උරා ගැනීමේ හැකියාවට බලපානවා. බොහෝමයක් බෝග, පසේ pH අගය පරාසය 5.5 සිට 7 දක්වා ඉතා හොඳින් පෝෂක උරා ගැනීම සිදු කරනවා.

පස් පරීක්ෂාවෙන් ඔබේ පසේ pH අගය, ඊලඟ වගාවට යෝග්‍ය වේද, නැතහොත් pH අගය නිසි මට්ටමට සැකසිය යුතුනම්, යෙදිය යුතු අලුහුණු හෝ ඩොලමයිට් ප්‍රමාණය පිළිබඳ නිර්දේශයක් ලබා දෙනවා.

සාමාන්‍යයෙන් අපේ රටේ වගා කරන ප්‍රදේශ වල pH අගය වැඩි පස් හමුවන්නේ කලාතුරකින්. එවැනි අවස්ථාවක, පසේ pH අගය නියමිත පරාසයට සකසා ගැනීම සඳහා ඔබ ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකගේ (AI) සේවය ලබාගන්න.

පසේ EC අගය දැන ගැනීමට හැකිවීම

EC අගය පසේ අඩංගු ලවණ මට්ටම පිළිබඳ අදහසක් ලබා දෙයි. වැඩි ලවණතාවයක් ඇති පසක් ඇති විට බෝග වලට පෝෂක සහ ජලය උරා ගැනීමට බාධා වෙනවා. ඒවගේම බෝග වලට විෂ තත්වයක් ඇති කරනවා. එබැවින් අස්වැන්න අඩු වෙනවා.

පසෙහි ලවණතාවය සම්පූර්ණයෙන් ඉවත් කරන්න බෑ. නමුත් වැඩිපුර ජලය යොදා පසේ ඇති වැඩිපුර ලවණ යම් තරමකට සෝදා හැරීම හා පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම මගින් EC මට්ටම පාලනය කර ගන්න පුළුවන්.

බොහෝමයක් බෝගවල වර්ධනය සඳහා EC 0.8 - 1.8 dS/m පරාසය හිතකර වෙනවා.

පසෙහි pH සහ EC මට්ටම් අවබෝධ කර ගැනීමෙන්, ගොවීන්ට එම පසට යෝග්‍ය බෝග තෝරා ගැනීම, පෝෂක කළමනාකරණය සහ වාරි ක්‍රම සම්බන්ධයෙන් දැනුවත් තීරණ ගත හැකි අතර, ඒ නිසා අවසානයේ වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකියාව ලැබෙනවා.



පාංශු විශ්ලේෂණ වාර්තාව - පිටුව 1

Soil - Analytical Report

Central Soil & Fertilizer Testing Laboratory
Horticultural Crops Research & Development Institute
Gannoruwa, Peradeniya
Telephone: 081-2388011-3

ISO/IEC 17025
TL 090 - 01

Customer : [redacted] Address : [redacted]	FARM Location &Extent : Dunuke ulla Province : Central District : Kandy

Crop Group : Vegetable
Customer ID : 01
Date of receipt : 2024/04/25
Suitability of sample : Suitable for analysis
Sample Weight : 1kg

Lab ID : ST/2024/107

Date of tests performed: 2024/05/10

Test Results

Soil Characteristics	Test Method	Results	Interpretation**
pH (1:1 in water)/පි.එච්. අගය	*CS &FTL / P /7.2/03.1 (pH)*	5.3	Moderately acidic / තරමක් ආම්ලිකයි
EC (dS/m) (1:5 water)/විද්‍යුත් සන්නායකතාවය	*CS &FTL / P /7.2/03.2 (EC)*	0.057	Low / අඩුයි
Available P (ppm)/ලබාගතහැකි පොස්පරස්	*CS &FTL / P /7.2/03.3 (AV-P)*	40.0	High / වැඩියි
Exchangeable K as Ammonium acetate extract (ppm)/හුවමාරු වියහැකි පොටෑසියම්	*CS &FTL / P /7.2/03.4 (EX-K)*	272.3	Medium / මධ්‍යස්ථයි
Organic matter (%) /කාබනික ද්‍රව්‍ය	*CS &FTL / P /7.2/03.6 (OM)*	3.48	Low / අඩුයි
*Texture/වයනය	*By Feel*	Sand	Not Sutable / සුදුසු නැත

*Non Accredited

This report refers only to the samples submitted on 2024/04/25by the customer identified in this report.
***** Interpretation is given according to the fertilizer recommendations for only food crops developed by Department of Agriculture***
Interpretation and annexes 3/5 are not applicable for "Other Crop Group"

Fertilizer Recommendations for Horticultural Crop, (2010)
Manual of Soil Test Based Fertilizer Recommendation for Rice, (2014)
Soil Test Based Fertilizer Recommendations , (1995, : Department of Agriculture)
Techno Guide for Crop Recommendations , (2020)

Analyzed by

Checked by

Authorized Signatory

2024/05/13
Date

Opinion on Results is attached in annexes - 3 / 5

HEAD
DIVISION OF CHEMISTRY
HORTICULTURAL CROP RESEARCH & DEVELOPMENT INSTITUTE
DEPARTMENT OF AGRICULTURE
GANNORUWA, PERADENIYA

1 of 1

පාංශු විශ්ලේෂණ වාර්තාව - පිටුව 2

ඇමුණුම - 3 ST/2024/107

මෙම ක්ෂේත්‍රයේ

1. පී.එච් (pH) අගය අනුව පස,

   ~~ඉතා ආම්ලිකයි/ආම්ලිකයි/~~තරමක් ආම්ලිකයි/~~සුළු වශයෙන් ආම්ලිකයි/උදාසීනයි~~

   - ඩොලමයිට් යෙදීම ~~අවශ්‍යයි~~/අවශ්‍යය නැත, එහෙත්, මීලඟ කන්නයේදී පසෙහි පී.එච් (pH) අගය පරීක්ෂා කරගන්න.
   - පී.එච් (pH) අගය 5 ට අඩුනම් පමණක් අක්කරයට ඩොලමයිට් කි.ග්‍රෑම් 800 ක් බිම් සැකසීමේදී පසට යොදා හොඳින් පස සමඟ මිශ්‍ර කරන්න.

2. විද්‍යුත් සන්නායකතාවය (EC) අනුව මෙම පසෙහි ලවණතාවය ~~ඇත/ඇතිවීමට ඉඩ ඇත~~/නැත. නමුත් සැමවිටම ක්ෂේත්‍රයේ ජලවහනය දියුණු කිරීමට කටයුතු කරන්න.

3. පසෙහි පවතින පොස්පරස් ප්‍රමාණය ~~අඩුයි/මධ්‍යස්ථයි~~/වැඩියි.

   - පොස්පරස් අඩංගු රසායනික පොහොර යෙදීම අවශ්‍යයි/~~අවශ්‍යය නැත.~~
   - ඇමුණුම 5 හි සඳහන් කර ඇති පොස්පරස් අඩංගු රසායනික පොහොර (ටී.එස්.පී) ප්‍රමාණය පමණක් වගාවට යොදන්න.

4. පසෙහි අඩංගුව ඇති පොටෑසියම් ප්‍රමාණය ~~ඉතා අඩුයි/~~අඩුයි/මධ්‍යස්ථයි/~~වැඩියි.~~

   - පොටෑසියම් අඩංගු රසායනික පොහොර යෙදීම අවශ්‍යයි./~~අවශ්‍යය නැත~~.
   - ඇමුණුම 5 හි සඳහන් කර ඇති පොටෑසියම් අඩංගු රසායනික පොහොර (එම්.ඕ.පී) ප්‍රමාණය පමණක් වගාවට යොදන්න.

5. පසෙහි පවතින කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය අඩුයි/~~ප්‍රමාණවත්ය/වැඩියි.~~

   - කාබනික පොහොර අක්කරයට කි/ග්‍රෑම් 4000 ක් යොදන්න.
   - කාබනික පොහොර ලෙස කුකුල් පොහොර භාවිතා කරන්නේ නම් අක්කරයට කි.ග්‍රෑම් 2000 ක් ප්‍රමාණවත්ය.
   - ~~මෙම තත්ත්වය දිගටම පවත්වාගෙන යන්න.~~

6. වී වගාව සඳහා යූරියා යෙදීමේදී පත්‍ර වර්ණ දර්ශකය භාවිතාකර ඒ අනුව යොදන්න.

.... 2024/05/21......................

අත්සන දිනය

HEAD
DIVISION OF CHEMISTRY
HORTICULTURAL CROP RESEARCH
& DEVELOPMENT INSTITUTE
DEPARTMENT OF AGRICULTURE
GANNORUWA, PERADENIYA.

පාංශු විශ්ලේෂණ වාර්තාව - පිටුව 3

ඉදිරි වගාව සඳහා පොහොර නිර්දේශය

ST/2024/107

නිර්දේශය

ඇමුණුම 05

පොහොර නිර්දේශ කරන බිම් ප්‍රමාණය අක්කර 01 ක් සඳහා

බෝගය / යෙදිය යුතු පොහොර වර්ගය හා ප්‍රමාණය	මූලික පොහොර			1 වන මතුපිට පොහොර		2 වන මතුපිට පොහොර		3 වන මතුපිට පොහොර		4 වන මතුපිට පොහොර		5 වන මතුපිට පොහොර	
	යූ/ඇමෝනියම් සල්ෆේට් Kg/Ac	ටී.එස්.පී Kg/Ac	එම්.ඕ.පී Kg/Ac	යූ/ඇමෝනියම් සල්ෆේට් Kg/Ac	එම්.ඕ.පී Kg/Ac	යූ/ඇමෝනියම් සල්ෆේට් Kg/Ac	එම්.ඕ.පී Kg/Ac	යූ/ඇමෝනියම් සල්ෆේට් Kg/Ac	එම්.ඕ.පී Kg/Ac	යූ/ඇමෝනියම් සල්ෆේට් Kg/Ac	එම්.ඕ.පී Kg/Ac	යූ/ඇමෝනියම් සල්ෆේට් Kg/Ac	එම්.ඕ.පී Kg/Ac
මාළු මිරිස්	40	22	13	40	13	40	13	—	—	—	—	—	—
	සිටුවීමට පෙර			සිටුවා මාස 1 න්		සිටුවා මාස 2 න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්	
	සිටුවීමට පෙර			සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්	
	සිටුවීමට පෙර			සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්	
	සිටුවීමට පෙර			සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්	
	සිටුවීමට පෙර			සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්	
	සිටුවීමට පෙර			සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්	
	සිටුවීමට පෙර			සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්	
	සිටුවීමට පෙර			සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්		සිටුවා සති........න්	

අත්සන
(නිල මුද්‍රාව)

HEAD
DIVISION OF CHEMISTRY
HORTICULTURAL CROP RESEARCH
& DEVELOPMENT INSTITUTE
DEPARTMENT OF AGR... UR
GANNORUWA, PER...

2024/05/21
දිනය

Page 1 of 1

8 ඔබේ පස පරීක්ෂා කර ගන්නේ කොහොමද?

ඔබේ වගා බිමේ පස් සාම්පලයක් නියමිත පරිදි සකස් කරලා, එය ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකට ගෙනිහින් දෙන්න. ඔහු පස් සාම්පලය පරීක්ෂණාගාරයට යවලා පරීක්ෂා කරලා දෙනවා.

පස් සාම්පලයක් සකස් කර ගන්නා ආකාරය

අවශ්‍යය ද්‍රව්‍ය
- උදැල්ලක් හෝ පාංශු අවගාරයක් (ඕගරයක්),
- පස් එකතු කිරීම සඳහා පිරිසිදු පොලිසැක් මල්ලක්,
- සාම්පලය සකසා ගැනීමට පිරිසිදු පොලිතින් කැබැල්ලක්,
- රසායනාගාරයට යවන සාම්පලය (500g) දැමීම සඳහා පොලිතින් කවර දෙකක්,
- රබර් බෑන්ඩ්,
- පෑනක් සහ කාඩ්බෝඩ් කැබලි දෙකක්.

පස් සාම්පල ලබා ගැනීමේදී මේ කරුණු ගැන සැලකිලිමත් වෙන්න ඕනා.

- හැකි සෑමවිටම කන්න දෙකක් අතරතුර කාලයේදී පස් සාම්පල ලබා ගන්න.
- බෝගය ක්ෂේත්‍රයේ පවතින විට සාම්පල ලබාගැනීමට සිදුවුනොත් පොහොර යෙදීමට පෙර පේළි දෙකක් අතරින් සාම්පල ලබා ගන්න.
- පසේ වර්ණය, වයනය, ජලවහනය එක හා සමාන ඉඩම් කොටස් තනි ඒකකයක් ලෙස සලකන්න. එවැනි එක් එක් ඉඩම් ඒකක සඳහා වෙන වෙනම සාම්පල ගන්න. ඒ කියන්නේ එකම ඉඩමක උනත්, ඉඩමේ තැනින් තැනට පස වෙනස් නම්, ඒ එක් එක් පස සඳහා වෙන වෙනම පස් සාම්පල පිළියෙළ කරන්න ඕනා.
- පොහොර හෝ කාබනික ද්‍රව්‍ය ගොඩගසා තිබූ ස්ථාන හෝ කසල එකතුකර තිබූ ස්ථාන හෝ ඇල මාර්ග අසලින් පස් සාම්පල ගන්න එපා.
- පොහොර හෝ කාබනික ද්‍රව්‍ය අඩංගුව තිබූ ඇසුරුම්, භාජන සහ උපකරණ පස් සාම්පල ලබා ගැනීමට භාවිතා කරන්න එපා.
- පස් සාම්පල ඇසුරුම් කිරීම සඳහා රෙදි හෝ කඩදාසි කවර භාවිතා කරන්න එපා.

ඔබේ වගා බිමේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි පස් සාම්පල ලබා ගැනීම සඳහා ස්ථාන හඳුනා ගන්න. (අක්කරයකට ස්ථාන 8 කින් පමණ). මේ සඳහා පහත ක්‍රම අනුගමනය කල හැකියි.



1. හඳුනා ගත් ස්ථාන වල මතුපිට ඇති වල්පැල, කාබනික ද්‍රව්‍ය, ගල් බොරළු, ආදිය සූරා ඉවත් කරන්න.



2. රූපයේ පරිදි උදැල්ල භාවිතා කරමින් මතුපිට සිට අඟල් 6ක් ගැඹුරට කපා අඟලක පමණ ගනකමට පස් තට්ටුවක් පස් එකතු කරන මල්ලට එකතු කර ගන්න.

3. එකතු කර ගන්නා ලද සියලු පස් පිරිසිදු මතුපිටක අතුරන්න. ගල්, බොරළු, මුල් කැබලි හා වෙනත් අපද්‍රව්‍ය ඉවත් කරන්න. ඉන්පසු සියළු පස් හොඳින් මිශ්‍ර කර ගන්න.

4. රූපයේ පරිදි මිශ්‍ර කර ගත් පස් තුනී කර කොටස් හතරකට බෙදා ඉන් කොටස් දෙකක් ඉවත් කරන්න. ඉතිරි කොටස් දෙක හොඳින් මිශ්‍ර කර ගන්න. නැවත නැවත මෙසේ කිරීමෙන් පසු අවසාන පස් මිශ්‍රණය 500g වන ලෙස සකස් කර ගන්න.

5. ඉහත සාදාගත් 500g පමණ වන පස් සාම්පලය රූපයේ දැක්වෙන පරිදි රසායනාගාරයට යැවීම සඳහා පොලිතින් ඇසුරුමක අසුරා ගන්න.



6. ඊළගට පස් සාම්පලයේ තොරතුරු පත්‍රිකාව පුරවා කෘෂිකර්ම උපදේශකට හෝ ළගම කෘෂිකර්ම රසායනාගාරයට වෙත බාර දෙන්න.

ඉහත පස් සාම්පල පිළියෙළ කිරීමේදී ඔබ ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකගේ සහය ලබා ගන්න.

9 නිසි විදියට ඊළඟ වගා කන්නයට පස සකස් කර ගමු

පස් පරික්ෂණයේ ප්‍රථිපල සහ නිර්දේශ වලට අනුව ඊළඟ වගාවට පස සකස් කර ගැනීම සිදු කල යුතුයි.

1. පළමුවෙන්ම මිට පෙර බෝගයේ පැරණි බෝග කොටස්, සුන්බුන් සහ වල් පැලෑටි වගා භූමියෙන් ඉවත් කරන්න. මෙය රෝග සහ පළිබෝධ ගැටළු වළක්වා ගැනීමට සහ පෝෂක සඳහා වල් පැල වල තරඟකාරිත්වය අඩු කිරීමට උපකාරී වෙනවා.

2. කොම්පෝස්ට්, කුකුළු පොහොර, ගොම පොහොර සහ එළු පොහොර වැනි හොඳින් දිරාපත් වූ කාබනික ද්‍රව්‍ය පසට එකතු කරන්න. කාබනික ද්‍රව්‍ය, පසෙහි ව්‍යුහය වැඩි දියුණු කරනවා, තෙතමනය රඳවා තබා ගැනීම වැඩි දියුණු කරනවා, ඒ වගේම බෝග වලට අත්‍යාවශ්‍ය පෝෂක සපයනවා.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශය - අක්කරයකට කාබනික ද්‍රව්‍ය 4000 Kg

3. පාංශු පරීක්ෂණයේ ප්‍රතිඵලයට අනුව ඔබේ පසේ pH අගය සැකසිය යුතුනම් නිර්දේශයට අනුව අළු හුණු හෝ ඩොලමයිට් පසට එකතු කරන්න.

4. පළමුව සීසෑම - පස බුරුල් කිරීමට සහ කාබනික ද්‍රව්‍ය සමඟ හොඳින් පසට මිශ්‍ර වන ලෙස පස පෙරලීම සිදු කරන්න.

5. දෙවනුව පස් කැට පොඩි කිරිම - පස මට්ටම් කිරීම හා බීජ හෝ බීජ පැළ සිටුවීමට සුදුසු සියුම් පසක් නිර්මාණය කිරීම සඳහා පස මතුපිට ඇති විශාල පස් කැට තවදුරටත් පොඩි කල යුතු වෙනවා.

10 බෝග වගාවේදී භාවිතා කරන පොහොර වර්ග

අමිශ්‍ර පොහොර

වී, එළවළු සහ ක්ෂේත්‍ර බෝග සඳහා බහුලව භාවිතා වෙනවා. මෙම පොහොර මගින් එක් ප්‍රධාන පෝෂකයක් පමණක් සපයනවා.

යූරියා - නයිට්‍රජන් (N) සපයනවා.
ත්‍රිපල් සුපර් පොස්පේට් (TSP) - පොස්පරස් (P) සපයනවා.
මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) - පොටෑසියම් (K) සපයනවා.

බෝගවල පෝෂක අවශ්‍යතාවය අනුව යෙදීමට ඉතාමත් පහසුයි.

මිශ්‍ර පොහොර

මේවා අමිශ්‍ර පොහොර දෙකක හෝ වැඩි ගණනක මිශ්‍රණ වේ.

උදාහරණ: 15 : 15 : 15 වැනි **NPK** මිශ්‍රණ

විවිධ සමාගම් මගින් බෝග-විශේෂිත මිශ්‍රණ සකසා විවිධ නම් වලින් වෙළඳපොලට නිකුත් කරනවා. සමාගම් මගින් මෙවැනි මිශ්‍ර පොහොර භාවිතය ප්‍රවර්ධනය කරණ අතර වෙළඳපොලේ බහුලව විකිනීමට තිබෙනවා.

බෝග සඳහා සකස් කරන ලද බෝග-විශේෂිත මිශ්‍රණ යෙදීම පහසුයි, කාලය ඉතිරි වෙනවා. නමුත්, ඔබේ පසේ පෝෂක අවශ්‍යතාවයට අනුව යොදන්න බෑ.

දියර පොහොර

බෝගවලට අවශ්‍ය පෝෂක ඉතාම ඉක්මනින් ලබා දීම සඳහා භාවිතා කරනවා. විශේෂයෙන් බෝගයේ කොළ මතට ඉසීම හෝ ජලයේ දියකර වාරි ජලය හරහා බෝගයට යොදනවා.

උදාහරණ:

NPK අඩංගු දියර පොහොර (ඇමෝනියම් නයිට්‍රේට්, ඩයි-ඇමෝනියම් පොස්පේට්, පොටෑසියම් සල්පේට් වැනි)

ද්විතික පෝෂක අඩංගු දියර පොහොර (කැල්සියම් නයිට්‍රේට්, මැන්ගනීස් සල්පේට් වැනි)

ක්ෂුද්‍ර පෝෂක අඩංගු දියර පොහොර - **(Zn, B, Fe)**

කාබනික දියර පොහොර - (ගැඩවිලි පණු කොම්පෝස්ට් නිස්සාරකය)

පෝෂක ඌණතාවයන් ඉක්මනින් නිවැරදි කිරීම සඳහා ප්‍රයෝජනවත් වෙනවා.

කාබනික පොහොර

තිරසාර හා පරිසර හිතකාමී ගොවිතැනක් සඳහා ඉතාමත් යෝග්‍ය වෙනවා.

උදාහරණ: **කොම්පෝස්ට්**
ගොවිපල පොහොර (ගව පොහොර, කුකුල් පොහොර)
කොළ පොහොර (උදා: සූරියකාන්ත, ග්ලිරිසීඩියා)

කාබනික පොහොර මගින් පාංශු ව්‍යුහය වැඩි දියුණු කර ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වයට හිතකර පරිසරයක් ඇති කිරීම තුලින් බෝග වර්ධනයට සාරවත් පසක් ලබා දෙනවා.

ජෛව පොහොර

ජෛව පොහොරවල පසෙහි අඩංගු පෝෂක බෝගවලට ලබා ගැනීමේ හැකියාව වැඩි කරන ප්‍රයෝජනවත් ක්ෂුද්‍ර ජීවීන් අඩංගු වන අතර එමගින් බෝගවලට අත්‍යවශ්‍ය පෝෂක අවශෝෂණය කර ගැනීම පහසු කරයි. ශ්‍රී ලංකාව තුල ඉතාම සුළු වශයෙන් භාවිතා වේ. ජෛව පොහොර මගින් පසේ අඩංගු පෝෂක ලබා ගැනීමේ හැකියාව වැඩි කරන නිසා රසායනික පොහොර භාවිතය අඩු කරන්න පුළුවන්.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොහොර නිර්දේශය ලබා දෙන්නේ අමිශ්‍ර පොහොර වලින්. ඊට හේතු කිහිපයක් තියෙනවා.

- මූලික පොහොර යෙදීමේදී NPK තුනම ඕන වුනත්, මතුපිට පොහොර දැමීමේදී අවශ්‍ය වෙන්නේ N සහ K විතරයි. නමුත් අපේ රටේ වෙළඳපොලේ ඇති බොහොමක් මිශ්‍ර පොහොර වල NPK තුනම අඩංගු වෙනවා. එනිසා මතුපිට පොහොර යෙදීමේදී මිශ්‍ර පොහොර භාවිතා කිරීමෙන් පසට වැඩිපුර පොස්පේට්(P) එකතුවීම සිදු වෙනවා. පසේ පොස්පේට්(P) වැඩිවීම නිසා බෝගවලට අත්‍යාවශ්‍ය කැල්සියම්, සින්ක් වැනි පෝෂක උරා ගැනීම අපහසු වෙනවා. මේ නිසා පෝෂක පසේ තිබුණත්, බෝග එවැනි පෝෂක ඌණතා පෙන්නන්න පුළුවනි.
- පස පරීක්ෂා කර ඒ ඒ පසට අවශ්‍ය ප්‍රමාණයට පොහොර නිර්දේශ ලබාදෙන නිසා ඒ ඒ පසට යෙදිය යුතු පෝෂක ප්‍රමාණයන් වෙනස්. එනිසා බෝගවලට අවශ්‍ය නිශ්චිත පෝෂක ප්‍රමාණයන් අමිශ්‍ර පොහොර වලින් යෙදීම කරන්න ඕනා.

අමිශ්‍ර පොහොර භාවිතය නිසා අනවශ්‍ය විදියට පසට පෝෂක එකතුවීමත්, වැඩිපුර පෝෂක සෝදාගෙන ගොස් අපේ වැව් ගංගා දූෂණය වීමත් වැළකෙනවා වගේම ඔබේ මුදලුත් ඉතිරි වෙනවා.

11 පොහොර භාවිතා කිරීමේදී ඔබ සූදානම් විය යුතු ආකාරය

රසායනික පොහොර, සම මතුපිට තැවරීම නිසා සමේ ආසාත්මික තාවයක් හෝ පිළිස්සීමට හේතු වෙන්න පුළුවන්. තවද කුඩා පොහොර කැටිති/දූවිලි ඇස් වල ගැටීම නිසා ඇස් වලට හානි සිදු වෙන්න පුළුවන්. පොහොර අංශු ආශ්වාස කිරීම පෙනහළු වලට හානි වෙන්නත් සමහර පොහොර වලට ඔබ දිගු වේලාවක් නිරාවරණය වීම නිසා විෂ සහිත වෙන්න පුළුවන්.

ඉහත විස්තර කරන ලද සෞඛ්‍ය ගැටළු සහ අනතුරු අවම කර ගැනීමට සම සමග පොහොර ගැටීම වළක්වා ගන්න ඕනා. මේ නිසා පොහොර භාවිතයට පෙර ඔබ නිසි ඇඳුම් කට්ටලයකින් (අත්වැසුම්, මුඛ ආවරණය, සපත්තු, අත් දිග කමිසය සහ දිග කලිසම) සැරසිය යුතුමයි.

පොහොර භාවිතයේදී පහත කරුණු හොඳින් මතක තබා ගන්න

- සේදිය හැකි ඇඳුම් අඳින්න:

  පොහොර යෙදීමේදී බොහෝ විට ඇඳුම් අපිරිසිදු වේ, එබැවින් අපිරිසිදු වූවාට කමක් නැති ඇඳුම් තෝරා ගන්න.

- පොහොර යෙදීමෙන් පසු:

  පොහොර ඔබේ සම මත ගෑවී ඇත්නම්, වහාම එවැනි ස්ථාන හොඳින් සබන් යොදා සෝදන්න. ඉන්පසු ඇඳුම් මාරු කරන්න.

12 පොහොර යොදන ආකාර

අපි පොහොර යෙදීම බෝග සිටුවීමට පෙරත් (මූලික පොහොර යෙදීම), බෝග වැඩෙන අවස්ථාවේදීත් (මතුපිට පොහොර යෙදීම) සිදු කරනවා.

a. මූලික පොහොර යෙදීම (Basal Dressing)

ඔබේ පාංශු පරීක්ෂණයේ ප්‍රතිඵල සහ ඊළඟට වගා කිරීමට බලාපොරොත්තු වන බෝගයේ පෝෂක අවශ්‍යතාව මත, ඔබට ලබා දී ඇති මූලික පොහොර නිර්දේශය බීජ හා බීජ පැළ සිටුවීමට දිනකට පෙර පසට එකතු කර හොඳින් මිශ්‍ර කර ගන්න ඕනා.

මූලික පොහොර යෙදීම වගා කරණු ලබන බෝගය අනුව ආකාර තුනකට සිදු කරන්න පුළුවන්.

I. මූලික පොහොර පස මතුපිට ඒකාකාරව විහිදූ වීම.

මුල් ගැඹුරට වර්ධනය වන කැරට්, රාබු, බීට්රූට් සහ ලීක්ස් වැනි එළවළු සඳහා සුදුසු වේ.



පාත්ති සෑදිය යුතු ස්ථානය තීරණය කර, වගා කිරීමට සූදානම් කර ඇති බෝගයේ වර්ධනයට සුදුසු වනසේ පස මට්ටම් කර පාත්ති සාදන්න.

බිජ හෝ බිජ පැළ සිටු වීමට දින එකකට පෙර මූලික පොහොර මිශ්‍රණය පාත්තියෙ පස මතුපිට ඒකාකාරව විහිදුවන්න.

මූලික පොහොර මිශ්‍රණය පාත්තියෙ පස සමග හොඳින් මිශ්‍ර වන සේ කලවම් කර අවසානයේ, බීජ පැලවීමට සුදුසු පරිදි පාත්තිවල මතුපිට සුමට කරන්න.

II. මූලික පොහොර පේළි ලෙස යෙදීම.

පේළි අතර ඉඩක් සහිතව වගා කරන මුල් ගැඹුරට වර්ධනය වන අර්තාපල්, බෝංචි, ගෝවා සහ බ්‍රොකොලි වැනි එළවළු සඳහා සුදුසු වේ.

1

පස සකස් කර පැළ සිටුවීම සඳහා නියමිත පරතරයට ඇලි හා වැටි සාදා ගන්න

2

වැටියේ පැළ සිටුවන ස්ථාන දිගට, අත් සවලක් භාවිතා කර සෙන්ටිමීටර 5-8 ක් පමණ ගැඹුරට අගලක් සාදා ඒවාට මූලික පොහොර මිශ්‍රණය යොදන්න. මේ සමග කාබනික ද්‍රව්‍ය කුඩා ප්‍රමාණයක් එකතු කිරීම වඩාත් සුදුසුයි.

3

ඉන් අනතුරුව පොහොර මිශ්‍රණය පස සමග මිශ්‍ර කරන්න.

4



පොහොර බීජ හා බීජ පැළ සමග සෘජුව සම්බන්ධ නොවන පරිදි සෙන්ටිමීටර 2-3 ක පමණ පස් තට්ටුවකින් ආවරණය කරන්න. දිනකට හෝ දෙකකට පසුව බීජ හෝ බීජ පැළ සිටුවන්න.

III.. මුලික පොහොර පැළ සිටුවීමට නියමිත වලවල් යෙදීම

තක්කාලි, මාළු මිරිස්, මිරිස් හා වම්බටු වැනි බෝග සඳහා යෝග්‍ය වේ.



නිසි පරතරයට වලවල් කපන්න.



පොහොර වලවල් වලට යොදා පස සමග මද ලෙස මිශ්‍ර කරන්න.

දිනකට හෝ දෙකකට පසු බීජ පැළ සිටු වන්න.



පැළ පස් යොදා වසන්න



පස නිසි පමණට තෙත්වනසේ ජලය යොදන්න

පොහොර කෙලින්ම පැල සිටුවීමට නියමිත වලවල් වලට යොදනු ලැබේ. පොහොර පස සමග මද ලෙස මිශ්‍ර කරන්න. පොහොර වැසෙනසේ සෙන්ටිමීටර 2-3 ක පස් තට්ටුවක් දමන්න. දිනකට හෝ දෙකකට පසු බීජ පැළ සිටු වන්න. පස නිසි පමණට තෙත්වනසේ ජල සම්පාදනය කරන්න.

b. බෝග වැඩෙන අවස්ථාවේ පොහොර යෙදීම (Top Dressing)

ඔබේ පාංශු පරීක්ෂණයේ ප්‍රතිපල සහ ඔබ වගා කර ඇති බෝගයේ පෝෂක අවශ්‍යතාව මත, ඔබට ලබා දී ඇති මතුපිට පොහොර නිර්දේශය පසට එකතු කරන්න පුළුවන්. වගා කර ඇති බෝගය අනුව පොහොර යොදන ආකාර තුනක් තියෙනවා.

මතුපිට පොහොර යෙදීමට දිනකට පෙර වගාවට හොඳින් ජල සම්පාදනය කරන්න ඕනා බව හොඳින් මතක තබා ගන්න.

I.. පැළ පේළියේ පැති දිගේ පටියක් ආකාරයට පොහොර යෙදීම.



- මෙහිදී පැළ වල පාදමේ සිට සෙන්ටිමීටර 5-10 ක් දුරින් සෙන්ටිමීටර 2-3 ක් ගැඹුරට කාණුවක් සාදා එයට නිර්දේශිත ප්‍රමාණයට මතුපිට පොහොර යොදන්න.
- පොහොර මද වශයෙන් පස සමග මිශ්‍ර කර තුනී පස් තට්ටුවකින් ආවරණය කරන්න.
- පේළි අතර ඉඩක් සහිතව වගා කරන අර්තාපල්, බෝංචි, ගෝවා සහ බ්‍රොකොලි වැනි එළවළු සඳහා සුදුසු වේ.

II.. පැළය වටා රවුම් වළල්ලක් ලෙස පොහොර යෙදීම.



- පැළයේ පාදමේ සිට සෙන්ටිමීටර 5-10 ක් දුරින් පැළය වටා වළල්ලක් ලෙස සෙන්ටිමීටර 2-3 ක් ගැඹුරට කාණුවක් සාදා එයට නිර්දේශිත ප්‍රමාණයට මතුපිට පොහොර යොදන්න.
- පොහොර පස සමඟ මද වශයෙන් මිශ්‍ර කර තුනී පස් තට්ටුවකින් ආවරණය කරන්න.
- තක්කාලි වම්බොටු වැනි පරතරයකින් යුතුව වගා කරන එළවළු භෝග සඳහා වඩාත් සුදුසුය.

III.. පස මතුපිට ඒකාකාරව පොහොර යෙදීම.



- මෙම ක්‍රමයට පොහොර යෙදීමේදී පෝෂක හානිය අඩු කිරීම සඳහා වගාවට ජලය සැපයීමෙන් හෝ වර්ෂාපතනයෙන් පසුව පොහොර යෙදීම වඩාත් සුදුසු වේ.
- මුල් ගැඹුරට වර්ධනය වන කැරට්, රාබු, බීට්රූට් වැනි එළවළු සහ නිවිති, සලාද, කොත්තමල්ලි, අබ වැනි කොළ එළවළු වගාවන් වලට වඩාත් සුදුසු වේ.

මතුපිට පොහොර යෙදීමේදී සැලකිය යුතු කාරණා



- පැළයේ කඳේ පාමුලට කෙලින්ම පොහොර යොදන්න එපා. කඳේ සිට කුඩා දුරකින් පොහොර යෙදීම ඉතා හොඳයි.



- පැළයට වඩාත් කාර්යක්ෂමව පෝෂක අවශෝෂණය වීම සඳහා ක්‍රියාකාරී මූල අංකුර පිහිටා ඇති ස්ථානවලට පොහොර යෙදීම සිදු කරන්න. සාමාන්‍යයෙන් ක්‍රියාකාරී මූල අංකුර වලින් වැඩි ප්‍රමාණයක් පැළයේ පත්‍ර වියනේ පිටත සීමාවට සමාන්තරව පසේ පැතිරී ඇත.

- මතුපිට පොහොර කිහිප අවස්ථාවකදී යොදන විට, මූල පද්ධතියේ වර්ධනයට ගැලපෙන පරිදි සෑම අවස්ථාවකම පොහොර යොදන ස්ථානය වෙනස් කරන්න.



- වැසි දිනවල හෝ අධික වර්ෂාවට පෙර පොහොර යොදන්න එපා. මොකද, අපි යොදන පොහොර වැසි ජලය සමග සෝදාගෙන යන්න පුළුවන් නිසා.
- නිර්දේශිත පොහොර අනුපාතය පමණක් භාවිතා කරන්න. අධික ලෙස පොහොර යෙදීමෙන් පසෙහි ලවණ සාන්ද්‍රණය වැඩිවෙලා මුල්මගින් සිදු කරන පෝෂක අවශෝෂණය අඩු කරනවා. මේ නිසා මුල්වලට හානි වෙන්නත් පුළුවන් සමහර අවස්ථා වලදී මුල් මරණයට පවා හේතු වෙනවා.

ඵලදායී මතුපිට පොහොර යෙදීමක් සඳහා, නිවැරදි වෙලාවට, නිවැරදි ස්ථානයට, නිවැරදි පොහොර ප්‍රමාණය දැමීම ඉතා වැදගත් වෙනවා

13 පෝෂක වල ඌණතාවයන් සහ ප්‍රතිකර්ම

නිවැරදිව පෝෂක කළමනාකරණයක් සහ හොඳ ජල සම්පාදනයක් මගින් පසේ pH අගය සහ EC අගය බෝගවලට පෝෂක උරා ගැනීමට පහසු පරාසයක පවත්වා ගන්නවා නම් බොහෝවිට බෝගවලට පෝෂක ඌණතාවයක් ඇතිවෙන්නේ නෑ. නමුත්, කලාතුරකින් හරි එවැනි පෝෂක ඌණතාවයක් අපේ වගාවේ ඇතිවුනොත්, අපි කොහොමද ඒක අඳුරගන්නේ, ඒ වගේම එවැනි තත්වයන් මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවද කියලා බලමු.

නයිට්‍රජන් (N) ඌණතාවයකදී

පොදු ඌණතා ලක්ෂණ	මග හරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම
• බෝගයේ මේරූ පත්‍ර ඒකාකාරී ලෙස කහ පැහැයට හැරීම සිදු වෙනවා. මෙය විශේෂයෙන් ගහේ පහළ පත්‍ර වලින් පටන් ගෙන ඉහලට පැතිරීම සිදු වෙනවා. • බෝගයේ වර්ධනය අඩු වෙනවා. • බෝගයේ මල් පිපීම සහ ගෙඩි හට ගැනීම ප්‍රමාද වීම සිදු වෙනවා.	• යූරියා, ඇමෝනියම් නයිට්‍රේට් වැනි නයිට්‍රජන් බහුල පොහොර යෙදීම. • ඉක්මනින් නිවැරදි කිරීම සඳහා සාන්ද්‍රණය 0.5-1.0% වන යූරියා හෝ 0.3-0.5% ඇමෝනියම් සල්ෆේට් හෝ 0.2-0.5% වන කැල්සියම් නයිට්‍රේට් වැනි නයිට්‍රජන් අඩංගු දියර පොහොර පත්‍ර වලට ඉසින්න.

පොස්පරස් (P) ඌණතාවයකදී

පොදු ඌණතා ලක්ෂණ	මග හරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම
● බෝගයේ පරිනත පත්‍ර තද කොළ පැහැයට හැරී පසුව දම් පැහැයක් ගනී. පත්‍රවල කැඩෙන සුළු ස්වභාවය වැඩිවේ. ● පැරණි පත්‍ර දාර පිළිස්සුණු පෙනුමක් පෙන්නුම් කළ හැකිය. ● වර්ධනය බාල වන අතර බෝග කුරු වීම සිදුවිය හැක. ● මුල් වර්ධනය දුර්වල වේ. එමඟින් බෝගයේ ස්ථායීතාවය හා නියඟයට ඔරොත්තු දීමේ හැකියාව අඩු වේ. ● බෝගයේ මල් හට ගැනීම සඳහා වැඩි කාලයක් ගත වන අතර මල් සහ ගෙඩි අඩු ප්‍රමාණයක් නිපදවයි. අස්වැන්න අඩුවේ.	● සුපර් පොස්පේට් හෝ ඇමෝනියම් පොස්පේට් වැනි පොස්පරස් අඩංගු පොහොර යෙදීම. ● ඉක්මනින් නිවැරදි කිරීම සඳහා සාන්ද්‍රණය 0.2-0.5% වන ඩයි-ඇමෝනියම් පොස්පේට් වැනි පොස්පරස් අඩංගු දියර පොහොර පත්‍ර වලට ඉසින්න.

පොටෑසියම් (K) ඌණතාවයකදී

පොදු ඌණතා ලක්ෂණ	මග හරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම
• පත්‍ර මැද හරියට ආසන්න ප්‍රදේශයේ නාරටිත් ඒ අවටත් කොළ පාටට තියෙද්දි, මේරූ පත්‍ර වල කෙළවර සහ දාරයට ආසන්න ප්‍රදේශ කහ පැහැයට හෝ දුඹුරු පැහැයට හැරීම සිදුවේ. • පත්‍ර වල කහ පාට වුන හරියෙම පිළිස්සී ගිය ලප හෝ මිය ගිය දුඹුරු පාට ලප ඇති වේ. • බෝගයේ කඳ දුර්වල වේ. එවැනි දුර්වල කඳන් සහිත සමහර ගස් බිමට ඇද වැටෙයි. • බෝගයේ ගෙඩි හෝ කරල් හැකිලිලා, ඇඹරිලා ගිහිල්ලා වගේ නම්, ගෙඩියක්/කරලක් කඩලා බැලුවම, බීජත් හැකිලිලා, පුහුවෙලා වගේ නම් එකෙන් පෙන්නුම් කරන්නේ පොටෑසියම් පොහොර අඩු වීම තමයි	• පොටෑසියම් ක්ලෝරයිඩ් (මියුරේට් ඔෆ් පොටෑෂ්) හෝ පොටෑසියම් සල්ෆේට් වැනි පොටෑසියම් බහුල පොහොර යොදන්න. • ඉක්මනින් නිවැරදි කිරීම සඳහා සාන්ද්‍රණය 0.3-0.5% වන පොටෑසියම් සල්ෆේට් හෝ 0.5% පොටෑසියම් නයිට්‍රේට් වැනි පොටෑසියම් අඩංගු දියර පොහොර පත්‍ර වලට ඉසින්න.

කැල්සියම් (Ca) ඌණතාවයකදී

පොදු ඌණතා ලක්ෂණ	මග හරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම
• ගෙඩිවල අග කෙළවරේ අඳුරු, ගිලුණු ලප ඇති වී කුණුවීම සිදුවේ. • ලපටි පත්‍ර වල තුඩු හෝ දාර පිළිස්සුණු ස්වභාවයක් පෙන්නුම් කරයි. • නව පත්‍ර කෝප්පයක් හැඩයට වක්‍ර වූ, රැලි සහිත ස්වභාවයක් ගනී. • පත්‍ර සාමාන්‍ය ප්‍රමාණයට වඩා කුඩා විය හැකිය, ඇඹරුණු හෝ විකෘති විය හැකිය, පත්‍ර කෙළවර පිටුපසට නැමුණු ස්වභාවයක් පෙන්නුම් කරයි. • ඒසේම තද බල ඌණතාවයක් ඇත්නම් ගස් වල ළපටි අංකුර වියළීමද ළපටි මල් වේලිලා හැලීමද සිදුවෙනවා. • බෝග වර්ධනය අඩු වෙලා කුරු බෝග ඇතිවෙනවා. • මූල පද්ධතියේ වර්ධනය දුර්වල වේ. සමහර විට මුල් කුණුවීම සිදුවේ.	• ඉක්මනින් නිවැරදි කිරීම සඳහා කැල්සියම් නයිට්‍රේට් වැනි කැල්සියම් අඩංගු දියර පොහොර සාන්ද්‍රණයෙන් 0.2% පත්‍ර වලට ඉසින්න. • දිගුකාලීන නිවැරදි කිරීම සඳහා, නිර්දේශිත අනුපාතයට පසට හෝ වගා මාධ්‍යයට අළු හුණු (කැල්සියම් කාබනේට්) හෝ ඩොලමයිට් (කැල්සියම් මැග්නීසියම් කාබනේට්) මිශ්‍ර කිරීම මගින් පසේ කැල්සියම් මට්ටම වැඩි කර ගන්න පුළුවන්.

මැග්නිසියම් (Mg) ඌණතාවයකදී



පොදු ඌණතා ලක්ෂණ	මග හරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම
• බෝගයේ පැරණි පත්‍ර වල නාරටි සහ ඒ ආසන්න ප්‍රදේශ කොළ පැහැයෙන් තිබියදී නාරටි අතර ප්‍රදේශ කහ පැහැයට හැරෙනවා. • ගහේ මෝරපු, පරණ පත්‍ර වල පිට දාරයේ ඉඳලා ඇතුළ දක්වා කහ පාටට හැරෙනවා. • පත්‍ර කොටස් ඉතා තුනී වී වියළී යනවා. ඒ වගේ පත්‍රයක් කඩලා අරගෙන පොඩිකරොත්, පහසුවෙන් කෑලිවලට කැඩිලා යනවා. • වඩාත් දරුණු අවස්ථාවන්හිදී, පත්‍ර මායිම් වලින් ආරම්භ වී ඇතුළට ගමන් කරන රතු-දුඹුරු පැහැති ලප පත්‍ර මත දිස්විය හැකිය. • රෝග සහ පළිබෝධකයින් සඳහා ඔරොත්තු දීමේ හැකියාව හා බෝගයේ වර්ධනය අඩු වෙනවා. • මල් සහ ගෙඩි හැදීම අඩු කරනවා. අස්වැන්න අඩු වෙනවා.	• ඉක්මනින් නිවැරදි කිරීම සඳහා එප්සම් ලුණු (මැග්නීසියම් සල්ෆේට්) ජලයේ දියකර සාන්ද්‍රණයෙන් 0.2- 0.5% පත්‍ර මතට ඉසීම. • දිගුකාලීන නිවැරදි කිරීම සඳහා, නිර්දේශිත අනුපාතයට පසට හෝ වගා මාධ්‍යයට මැග්නීසියම් සල්ෆේට් යොදන්න.

සල්ෆර් (S) ඌණතාවයකදී

පොදු ඌණතා ලක්ෂණ	මග හරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම
• බෝගයේ ළපටි පත්‍ර ඒකාකාරිව කහ පැහැයට හැරීම සිදුවේ. • බෝගයේ වර්ධනය අඩු වේ, පත්‍ර කුඩා වෙයි, පත්‍ර වලයන් අතර දුර අඩු වෙලා බෝග කුරු වීම සිදු වේ. • මල් පිපීම හා ගෙඩි ඇතිවීම සඳහා වැඩි කාලයක් ගතවේ. • මල් හා ගෙඩි අඩු සංඛ්‍යාවක් ඇති වේ. අස්වැන්න අඩු වෙනවා.	• ඉක්මනින් නිවැරදි කිරීම සඳහා ඇමෝනියම් සල්ෆේට් හෝ පොටෑසියම් සල්ෆේට් හෝ මැග්නීසියම් සල්ෆේට් වැනි සල්ෆර් අඩංගු දියර පොහොර සාන්ද්‍රණයෙන් 0.2% පත්‍ර මතට ඉසින්න. • බෝගයට අවශ්‍ය සල්ෆර් පහසුවෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය pH අගය සහ EC අගය සකස් කර ගන්න. • දිගුකාලීන නිවැරදි කිරීම සඳහා, නිර්දේශිත අනුපාතයට පසට හෝ වගා මාධ්‍යයට සල්ෆර් එකතු කිරීම.

සාමාන්‍යයෙන්, පසට එකතු කරනු ලබන කාබනික ද්‍රව්‍ය මගින් බෝගවලට අවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක සියල්ලම වාගේ ලබාදෙන නිසා ක්ෂුද්‍ර පෝෂක ඌණතාවයන් ඇතිවීම සිදුවෙන්නේ ඉතාම කලාතුරකින්.

ඌණතා ලක්ෂණ පෙන්වන අවස්ථාවේදී පවා ක්ෂුද්‍ර පෝෂක අවශ්‍ය වන්නේ ඉතාම කුඩා ප්‍රමාණවලින් නිසා ක්ෂුද්‍ර පෝෂක ලබා දීම ඉතාම ප්‍රවේශමෙන් සිදු කල යුතුයි. විශේෂයෙන්, වෙළඳපොලේ ඇති ක්ෂුද්‍ර පෝෂක අඩංගු බොහෝමයක් දියර පොහොර වලට ප්‍රමාණවත් නිර්දේශයක් නොමැති නිසා ඒවා යෙදීමේදී ප්‍රවේශම් වෙන්න ඕනා. **මොකද වැඩිපුර යෙදුවොත් එම ක්ෂුද්‍ර පෝෂක බෝග වලට විෂ වීමට බොහෝ විට ඉඩ ඇති නිසා.**

ක්ෂුද්‍ර පෝෂක ඌණතා ලක්ෂණ	පොදු ඌණතා ලක්ෂණ වලට රූපමය උදාහරණ	මග හරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම
යකඩ (Fe) ▶ ලපටි පත්‍ර වල නාරටි අතර කහ පැහැයට හැරේ. ▶ ඌණතාවය වඩාත් උග්‍ර නම්, ලපටි පත්‍ර ලා කහ පැහැයේ සිට සුදු පැහැයට හැරේ. ▶ පත්‍ර කුඩා වේ. ▶ මල් පිපීම සහ ඵල හට ගැනීම දුර්වල වේ. ▶ බෝගය කුරු වීම සිදු වේ.	 මිරිස් වගාව	▶ ඉක්මනින් නිවැරදි කිරීම සඳහා අයන් කීලේට (උදා: Fe - EDTA) වැනි යකඩ ලබා දිය හැකි දියර පොහොරක් සාන්ද්‍රණයෙන් 0.5% පත්‍ර මතට ඉසීම. ▶ පසෙහි pH අගය නියමිත මට්ටම පවත්වා ගැනීම.
මැංගනීස් (Mn) ▶ ලපටි කොළ වල නාරටි අතර කහ පැහැයට හැරීම සිදු වේ. යකඩ ඌනතාවයේ රෝග ලක්ෂණ වලට සමාන නමුත් කහ පැහැ වු තැන් වල සාමාන්‍යයෙන් දුඹුරු පැහැ ලප ඇති වේ.	 තක්කාලි වගාව	▶ ඉක්මනින් නිවැරදි කිරීම සඳහා මැංගනීස් සල්ෆේට් වැනි මැංගනීස් ලබා දිය හැකි දියර පොහොරක් සාන්ද්‍රණයෙන් 0.2% පත්‍ර මතට ඉසීම. ▶ ක්ෂේත්‍රය හොඳින් ජලය ගලා යන ලෙස සකස් කරන්න.

ක්ෂුද්‍ර පෝෂක ඌණතා ලක්ෂණ	පොදු ඌණතා ලක්ෂණ වලට රූපමය උදාහරණ	මග හරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම
සින්ක් (Zn) ▶ මුලින්ම පැරණි පත්‍ර මත නාරටි අතර කහ පැහැයට හැරීම සිදුවේ. පසුව එම ස්ථාන දුඹුරු පැහැයට හැරේ. ▶ බෝගයේ අන්තරාල කෙටි වේ, රැලි සහිත කුඩා හෝ විකෘති වූ පත්‍ර ඇති වේ. ▶ බෝග වර්ධනය බාල වේ. අස්වැන්න අඩු වේ	 තක්කාලි වගාව	▶ ඉක්මනින් සින්ක් හිඟය නිවැරදි කිරීම සඳහා සින්ක් සල්ෆේට් හෝ සින්ක් අඩංගු කීලේට වැනි සින්ක් ලබා දිය හැකි දියර පොහොරක් සාන්ද්‍රණයෙන් 0.2% පත්‍ර මතට ඉසීම. ▶ පසට කාබනික ද්‍රව්‍ය එකතු කරන්න.
තඹ (Cu) ▶ ඇඹරුණු හෝ විකෘති වූ ලපටි පත්‍ර. ▶ පත්‍ර තද කොළ හෝ නිල් පැහැයට හැරීම. ▶ පත්‍ර සහ රිකිලි කෙළවර මිය යයි. ▶ වර්ධනය අඩාල වීම. ▶ මල් පිපීම දුර්වල කරයි.	 බෙල් පෙපර් වගාව	▶ ඉක්මනින් කොපර් හිඟය නිවැරදි කිරීම සඳහා, කොපර් සල්ෆේට් හෝ කොපර් අඩංගු කීලේට වැනි දියර පොහොරක් 0.2% සාන්ද්‍රණයෙන් පත්‍ර මතට ඉසින්න. ▶ තඹ අවශෝෂණයට බාධා කළ හැකි අධික පොස්පරස් මට්ටම වළක්වා ගන්න.
බෝරෝන් (B) ▶ විකෘති වූ පත්‍ර සහ අග්‍රස්ථ මිය යයි. ▶ කඳන් පහසුවෙන් බිඳෙනසුලු වීම. ▶ දුර්වල මල් පිපීම සහ මල් හැලීම. ▶ විකෘති වූ පලතුරු හෝ බීජ දුර්වල වර්ධනය.	 තක්කාලි වගාව	▶ නිර්දේශයට අනුව පසට බෝරැක්ස් (Borax) යෙදිය හැකිය. ඌණතාවය උග්‍ර නම් බෝරැක්ස් (Borax) ජලයේ දියකර 0.2% සාන්ද්‍රණයෙන් පත්‍ර මතට ඉසින්න. ▶ පසෙහි හොඳ තෙතමනයක් පවත්වා ගන්න.

ක්ෂුද්‍ර පෝෂක ඌණතා ලක්ෂණ	පොදු ඌණතා ලක්ෂණ වලට රූපමය උදාහරණ	මග හරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම
මොලිබ්ඩිනම් (Mo)* ▶ නයිට්‍රජන් ඌණතාවයට සමාන පැරණි පත්‍ර කහ වීම සහ තැනින් තැන දුඹුරු පැහැ ලප ඇතිවේ. ▶ රනිල කුලයට අයත් බෝග වල දුර්වල ගැටිති ඇතිවීම.		▶ සෝඩියම් මොලිබ්ඩේට් හෝ ඇමෝනියම් මොලිබ්ඩේට් යොදන්න. ▶ සාමාන්‍යයෙන්, අධික ආම්ලික පස් හෝ විශේෂිත භෝග වලට පමණක් අවශ්‍ය වේ.
ක්ලෝරීන් (Cl)* ▶ බෝග මැලවීම, පත්‍ර තඹ පැහැවීම හෝ රැලි වැටීම. ▶ වර්ධනය අඩු වීම. ▶ (ඉතාම කලාතුරකින් සිදුවේ)		▶ පොටෑසියම් ක්ලෝරයිඩ් හෝ සෝඩියම් ක්ලෝරයිඩ් එකතු කිරීම. ▶ සාමාන්‍යයෙන්, හොඳ ජල සැපයුමක් මගින් යතා තත්වයට ගත හැකි වේ.
නිකල් (Ni)* ▶ බීජ පැලවීම දුර්වල වේ. ▶ බෝග පත්‍ර අග්‍ර කහ පැහැයට හැරේ. පසුව දුඹුරු පැහැ වේ. පිලිස්සී ගියාක් මෙන් දිස් වේ. ▶ උසින් අඩු කුරු බෝග ඇතිවේ.		▶ නිකල් සල්ෆේට් හෝ නිකල් ක්ලෝරයිඩ් භාවිතා කරන්න. ▶ පොහොර සමතුලිතතාවය පවත්වා ගන්න.

* ඉහත ඌණතාවයන් ලංකාව තුල බහුලව දක්නට නොලැබේ.

(14) පොහොර භාවිතය පරිසරයට හා මිනිසුන්ගේ සෞඛ්‍යයට බලපෑම

නූතන කෘෂිකර්මාන්තයේ දී පොහොර අපට නැතුවම බැරි දෙයක් වෙනවා. පොහොර අපට ගුණාත්මයෙන් යුතු, වැඩි අස්වැන්නක් ලබා ගන්න උදවු වෙනවා වගේම මිනිසුන්ගේ සෞඛ්‍යයට හා පරිසරයට බලපෑම් ඇති කිරීමට හැකියාවක් තියෙනවා.







නයිට්‍රජන් අඩංගු රසායනික පොහොර වැඩිපුර භාවිතය මගින් වායුගෝලයේ හරිතාගාර වායු එකතු විම වැඩි කරනවා. එමගින් ඇති වන දේශගුණික විපර්යාස නිසා කෘෂිකර්මාන්තයත් ජන ජීවිතයත් අවදානමකට ඇද දමනවා.



දීර්ඝ කාලයක් තිස්සේ රසායනික පොහොර වලට නිරාවරණය වීම නිසා ගොවීන්ට දිගු කාලින ශ්වසන රෝග ඇතිවීමේ හැකියාව තියෙනවා.

15 බෝග කිහිපයක් සඳහා මුලික හා මතුපිට පොහොර නිර්දේශය පහත වගුවේ දක්වා ඇත.

(අක්කරයක් සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණය කි. ග්‍රෑ. වලින් සඳහන් කර ඇත)
සියලු බෝග සඳහා පස සකස් කරන අවස්ථාවේදී අක්කරයකට කාබනික පොහොරකි.ග්‍රෑ. 4000 ක් පමණ එකතු කරන්න.

බෝගය	මුලික පොහොර			1 වන මතුපිට පොහොර		2 වන මතුපිට පොහොර		3 වන මතුපිට පොහොර		4 වන මතුපිට පොහොර	
	යුරියා	ටි.එස්.පි.	එම්.ඕ.පි.	යුරියා	එම්.ඕ.පි.	යුරියා	එම්.ඕ.පි.	යුරියා	එම්.ඕ.පි.	යුරියා	එම්.ඕ.පි.
මාළු මිරිස්	40	88	26	40	26						
පිපිඤ්ඤා	30	80	24	30	24	30	24				
බණ්ඩක්කා	20	78	10	20	10	40	20	40	20		
කැකිරි	30	80	24	30	24	30	24				
පතෝල	30	78	24	30	24	30	24				
මිරිස්[1]	-	40	20	40	-	50	-	50	20	50	-
බෝංචි	44	108	30	44	30						
තක්කාලි[2]	26	130	26	26		26	26				
ගෝවා	-	110	30	44	-	44	30	44	-		
වම්බටු	30	130	34	30	-	30	34	30	-		

බෝගය	මූලික පොහොර			1 වන මතුපිට පොහොර		2 වන මතුපිට පොහොර		3 වන මතුපිට පොහොර		4 වන මතුපිට පොහොර	
	යූරියා	ටි.එස්.පි.	එම්.ඕ.පි.	යූරියා	එම්.ඕ.පි.	යූරියා	එම්.ඕ.පි.	යූරියා	එම්.ඕ.පි.	යූරියා	එම්.ඕ.පි.
ලීක්ස්	34	110	20	34		34	20	34		34	20
කැරට්		108		22	17.2	33	25.4	33	25.4	44	34
අර්තාපල්[3]	22	110	50	44		66	50				
බීට්රූට්	66	108	50	66	50						
බ්‍රොකොලි[4]		108	30	44		44	30	44			
බ්‍රොකොලි[5]	44	108	30	44	-	44	30				-
වට්ටක්කා	30	80	24	30	24	30	24				
එළබටු	30	130	34	30		30	34	30			

සැ.යු. - පළමු, දෙවන, තුන්වන හා හතරවන මතුපිට පොහොර යෙදිය යුතු කාල පරාසයන් බෝගයෙන් බෝගයට වෙනස් වේ. ඒ පිළිබඳ වැඩි විස්තර සඳහා අදාල බෝග අත්පොත හෝ කෘෂිකර්ම නිලධාරියා සම්බන්ධ කර ගන්න.

1 - මිරිස් පැල සිටුවා සති 16 කින් යූරියා 50 **Kg** ක් මතුපිට පොහොර යොදන්න.
2 - තක්කාලි - බදුල්ල දිස්ත්‍රික්කය සඳහා, ඉහත මූලික පොහොර මිශ්‍රණයේ, ට්‍රිපල් සුපර් පොස්පේට් අක්කරයකට කිලෝ ග්‍රෑම් 130 වෙනුවට අක්කරයකට කිලෝ ග්‍රෑම් 86 ක් යොදන්න.
3 - අර්තාපල් බීජ සිටු වීමට සති 2 කට පෙර අළු හුණු/ඩොලමයිට් කි. ග්‍රෑ. 800 ක් සහ සිටු වීමට දින 3-5 කට පෙර කුකුළු පොහොර කි. ග්‍රෑ. 2,000 හා ගොම පොහොර කි. ග්‍රෑ. 4,000 ක් යොදන්න.
4 - බ්‍රොකොලි - නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා පොහොර නිර්දේශය
5 - බ්‍රොකොලි -අනෙකුත් ප්‍රදේශ සඳහා (නුවරඑළිය හැර) පොහොර නිර්දේශය

ප්‍රකාශන හිමිකම

ප්‍රකාශන හිමිකම © 2025 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

සියලුම හිමිකම් ඇවිරිණි.

මෙම පොතේ අඩංගු කරුණු හා නිදර්ශන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දේපළක් වන අතර මෙම ප්‍රකාශනය හෝ නිදර්ශන වෙන වෙනම ප්‍රතිනිෂ්පාදනය කිරීමට අවශ්‍ය ලිඛිත අවසරය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අමතන්න.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
තැපැල් පෙට්ටිය 01,
පේරාදෙණිය, ශ්‍රී ලංකාව
දුරකථන අංකය - +94 812 388 331
විද්‍යුත් තැපැල - info@doa.gov.lk
වෙබ් අඩවිය - www.doa.gov.lk